**නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග කළ රු. 507,330 ක් වූ භාණ්ඩවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඊළඟ වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලය සහ උප්පුවෙලි මහජන පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැයකළ රු.1,945,865 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2021 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසි කිරීම සඳහා නිර්දේශිත අයිතම 42ක් සමාලෝචිත වර්ෂ කාල පරිච්ඡේදය තුළ රු.155,450කට වෙන්දේසියේ විකුණා තිබූ නමුත් ඒවාගේ වටිනාකම හඳුනාගෙන ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද භාණ්ඩ 2015 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයේ මිලදී ගත් බැවින් පිරිවැය සොයාගත නොහැක. කෙසේ වෙතත්, තොග ලේඛනයෙන් අඩු කිරීම සඳහා කටයුතු සලසා ඇති බව. | වෙන්දේසි කරන ලද භාණ්ඩවල පිරිවැය හඳුනාගෙන වත්කම්වලින් ඉවත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.412,705ක ස්ථාවර තැන්පතු පොලී ගිණුම්ගතකර නොතිබුණි. | බැංකුව විසින් සපයනු ලැබූ තොරතුරු මත බැංකු පොලී ආදායම ගිණුම්වල දැක්වේ. එසේම, ඉදිරි කාලයේ උපචිත පදනම මත ගිණුම් මෙහි හෙළිදරව් වනු ඇති බව. | පොළී ආදායම උපචිත පදනමට ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබුණු රු.1,400,000ක් වටිනා ඖෂධ රජයේ වාර්ෂික ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී මෙවැනි වැරදි සිදුනොවන අයුරින් සියළුම ගිණුම්ගත කිරීම් සහිතව මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 වන දිනට ප්‍රාදේශීය සභාව යටතේ පවතින ආයුර්වේද රෝහලේ ඖෂධ, විදුලි උපකරණ, ලිපි ද්‍රව්‍ය, වාහන ටයර් සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍යවල වටිනාකම රු.4,641,291කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | අවසාන තොගයේ වටිනාකම නිවැරදිව හෙළිදරව් කිරීම සඳහා සුදුසු පියවර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී, දේපළ බදු රැස්කිරීමේ ඵලදායිතාව වැඩිකිරීම සඳහා ලබාදුන් වට්ටම් රු.2,473,535ක් ගිණුම්වල වෙනම ඉදිරිපත් නොකර රැස්කළ දේපළ බදුවලින් අඩු කර දක්වා තිබුණි. | ඉදිරියේදී දේපළ බදු සඳහා ලබාදෙන වට්ටම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන අතර නිවැරදි ගිණුම්ගත කිරීම් සහිතව මූල්‍ය ප්‍රකාශන | ආදායම් වියදම් නිවැරදිව දැක්විය යුතුය. |

සකස් කරන බව.

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂ 04ක එකතුව රු. 44,227,124 ක් සහ මූලික ලියවිලිවල දක්වා ඇති රු.44,135,872ක් වූයෙන් රු.91,252ක වෙනසක් විය. | 2003 වර්ෂයේ සිට සිදුවූ ගිණුම්කරණ දෝෂ හේතුවෙන් මූලික ලියවිලි හා මූල්‍ය ප්‍රකාශන අතර වෙනසක් පැවැතුණි. මෙය නිවැරදි කිරිමට කපාහැරීමේ කමිටුවක් සඳහා සභාවේ අනුමැතිය සහ පළාත් පාලන කොමසාරිස් වරයාගේ අනුමැතිය ලැබී ඇත. ඉදිරියේදී කමිටු රැස්වීම් පවත්වා නිර්දේශ පදනම් කරමින් ක්‍රියාමාර්ග ගන්නා බව. | මූලික ලියවිලි ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ශේෂයන් අනුකූල විය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.261,368,978 ක් වටිනා ගිණුම් ශේෂ 04 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ සංවර්ධන කාර්යයන් සඳහා වූ ලැයිස්තු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | පිළිතුරු ලබාදී නොමැත. | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සුදුසු සාක්ෂි ආධාර පවත්වාගෙන යා යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය. | ප්‍රාදේශීය සභාවේ සේවය කරන ඇප මුදල් අයකළ යුතු නිලධාරීන් 18කගෙන් රු.262,500ක ආරක්ෂිත ඇප තැන්පතු අයකර නොතිබුණි. | නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,031,797ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 44,237,824ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම රු. "000" | 2022 බිල්කළ ආදායම රු."000" | 2022 රැස්කළ ආදායම රු."000" | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. "000" | 2021 ඇස්තමේන්තුගත ආදායම රු. "000" | 2021 බිල්කළ ආදායම රු. "000" | 2021 රැස්කළ ආදායම රු. "000" | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු."000" |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 28,516 | 27,405 | 25,467 | 24,750 | 27,000 | - | 20,609 | 22,812 |
| කුලී | 7,247 | 8,367 | 5,443 | 4,365 | 2,291 | - | 2,495 | 1,441 |
| බලපත්‍ර ගාස්තු | 6,405 | 2,171 | 2,171 | 99 | 7,000 | - | 4,222 | 99 |
| වෙනත් ආදායම් | 13,019 | - | 14,391 | - | 8,348 | - | 13,651 | -- |
| එකතුව | 55,187 | 37,943 | 47,472 | 29,214 | 44,639 | - | 40,977 | 24,352 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| 2022 දෙසැම්බර් 31 දිනට 01 සිට 08කට අධික කාලයට හිඟහිටි දේපළ බදු රු. 24,749,567ක් විය. | හිඟහිටි දේපළ බදු අයකිරීම සඳහා K ආකෘති පත්‍රයේ හිඟහිටි වටිනාකමත් සඳහන් කර නිකුත් කරමින් පවතින බව. | හිඟහිටි අයකිරීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) අනෙකුත් ආදායම් | | |
| 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ සංචාරක නිකේතන 05කින් (hotels) බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | කොවිඩ් වසංගතය සහ 2022 පැවැති ආර්ථික අර්බුදය හේතුවෙන් සංචාරකයින්ගේ නොපැමිණීම නිසා ආදායම් අඩුවී තිබුණි. මේ හේතුවෙන් බදු ගෙවා නොමැති බව. | තහුරු ව්‍යවස්ථා පනවා බලපත්‍ර ගාස්තු අයකළ යුතුය. |

(ඇ) මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.39,070,250ක් විය. | ඉල්ලීම් කර ඇති බව. | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 81 අනුව ගෙන්වාගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් CGL ආයතනය සමග 2017 වර්ෂයේ ගිවිසුමකට එළැඹ තිබූ අතර එකී ගිවිසුමේ පැවැති කොන්දේසි විගණන දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ෙගිවිසුමේ 2.3 වගන්තිය ප්‍රකාරව සභාවේ රැස්කරනු ලබන කසල දැනට ක්‍රියාත්මක කර නොමැති ජෛව එතනෝල්, තාපක පෙති, කොම්පෝස්ට්, හයිඩ්‍රජන්, සත්ව ආහාර සහ වාරිමාර්ග පද්ධති වැනි වාණිජ නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමට සභාව එකඟ වී තිබූ නමුත් වර්තමානය වන විටත් මෙය ක්‍රියාත්මක කර නොතිබණි. එසේම කින්නියා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයට අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් වනසත්ව හා සෞඛ්‍යය ගැටළු පැන නැගී තිබුණි. | ගිවිසුම ප්‍රකාරව සියළුම ක්‍රියාකාරකම් අදාල CGL ආයතනය විසින් ක්‍රියාත්මක කර තිබිය යුතු වේ. එසේ වුවත්, එලෙස සිදුකර නොතිබුණි. අදාල ගිවිසුමේ සඳහන් පරිදි CGL ක්‍රියාකාරකමක් ඉටු කිරීමේදී මෙම සැලැස්ම සඳහා අපගේ දායකත්වයත් සපයනු ලබන බව සහ අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් කරන බව. | ගිවිසුම ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපළ හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුද්ගලික ඉඩම් කට්ටි කිරීමේදි ප්‍රාදේශීය සභාවේ පොදු භාවිතය සඳහා වෙන්කළ සියයට 10ක් හෙවත් 01A 07R 7.29Pක වපසරියකින් යුත් ඉඩම් ප්‍රාදේශීය සභාව විසින් කිසිදු පොදු භාවිතයක් සඳහා යොදවා නොගෙන වර්ෂ 05කට අධික කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. | ඉදිරි කාලයේදි මෙම ඉඩම් භාවිතා කිරීමට අප විසින් සියළුම ක්‍රියාමාර්ග ගන්නා බව. | භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පුරනැගුම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේ ඉදිකළ කඩකාමර 16කින් සමන්විත කඩකාමර සංකීර්ණයේ කඩකාමර 03ක් 2014 වර්ෂයේ සිට මේ දක්වා කුලියට දී ආදායම් ඉපැයීමට පියවර ගෙන නොතිබුණි. | කඩකාමර 02ක් කිසිදු ඉල්ලීමක් නොවූ බව. | ආදායම් ඉපැයීමට සුදුසු කඩකාමර කුලියට දීමට පියවර ගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නඩත්තුව හා අළුත්වැඩියා නොකිරීම** | | |
| සභාවට අයත් වාහන 08ක් අළුත්වැඩියා කිරීමට නියමිතව තිබූ නමුත් එම අලුත්වැඩියාවන් සිදුකර ඒවා භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් අදාල යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් විමසා සුදුසු අළුත්වැඩියා කිරිමේ ස්ථානයකින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | අළුත්වැඩියා කර සභාවේ භාවිතය සඳහා යෙදවීමට පියවර ගත යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ග්‍රාමීය මාර්ග හා අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන (RRDP) යටතේ සභාවේ මාර්ග 08ක් සහ කානු පද්ධති 03කට කොන්ක්‍රීට් දමා සකස් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.17,472,215ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | ඉදිකළ මාර්ග 03ක විශාල ප්‍රමාණයේ පිපිරුම් ස්ථාන 08ක් පැවැතුණි. | RRDP කාර්යයන් 2021 වර්ෂ අවසානයේ නිම වීමෙන් නඩත්තු කාලයේ සිදුවූ අඩුපාඩු නිවැරදි කිරීමට සියළුම ප්‍රජා මූල සංවිධානවලට දැනුම් දී ඇති බව. | අඩුපාඩු නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉදිකරනු ලැබූ මාර්ග 02ක මතුපිට $0.683m^3$ ප්‍රමාණයේ විශාල වලවල් (Pits) දක්නට ලැබුණි. | කොන්ත්‍රාත්කරු වන ප්‍රජා මූල සංවිධානයට දැනුම් දුන් නමුත් ඔවුන්ට සම්පූර්ණයෙන් ගෙවීම් නොකිරීම නිසා නොසැලකිලිමත්ව සිටිති. සභාව මගින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | -එම- |
| (ඇ) | ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් තාක්ෂණික නිලධාරීන්ගේ ඉටුකළ බවට නිර්දේශ ලබාගෙන එකතුව රු.300,000ක් ගෙවීම් කර තිබුණි. | ඉහත කරුණ සම්බන්ධයෙන් සභාව විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා බව. | නිම නොකළ කාර්යයන් වෙනුවෙන් සිදුකළ ගෙවීම් අයකර ගතයුතුය. |
| (ඈ) | කොන්ක්‍රීට් දමා නිමකළ මාර්ග දෙපැත්තේ ගස් සිටුවීම සඳහා එකතුව රු.80,000ක් ඇස්තමේන්තු කර ගෙවීම් සිදුකර තිබූ නමුත් එම වැඩසටහන අවසන් කර නොතිබුණි. | ගස් සිටුවීම කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකළහොත් ඇප මුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව. | අඩුපාඩු නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5 හඳුනාගත් වංචා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපළ බදු සම්බන්ධ මුදල් ගනුදෙනු, ලදුපත් පිළියෙල කිරීම හා නිකුත් කිරීම වැනි කාර්යයන් සඳහා වැඩබිම් කම්කරුවකු සහ කාර්යාල සහායකයෙකු රාජකාරියේ යෙදීම සභාව අනුමත කර තිබූ අතර එමගින් රු.3,421,402ක මූල්‍ය වංචාවක් සිදුවී තිබුණි. ඉහත හිඟහිටි ශේෂය තුළ මෙම මූල්‍ය වංචාවේ වටිනාකමත් ඇතුළත්ව තිබුණි. | දේපළ බදු වංචාව සම්බන්ධයෙන් අධිකරණ නඩු පැවරීම් කටයුතු සිදු කරන බව. | වංචා කළ මුදල් අයකරගැනීමට පියවර ගැනීම සහ විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක ණය | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ සේවකයෙකුගෙන් අයකර ගතයුතු ආපදා ණය රු. 227,500ක් සහ සේවය හැරගිය නිළධාරියෙකුගෙන් රු.64,616ක් අයවිය යුතුව පැවතුණි. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තු කළ වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 78ක් දක්වා විචලනයන් වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | රටෙහි පැවැති ආර්ථික අර්බුදය සහ භාණ්ඩවල මිලගණන් වැඩිවීමේ අයහපත් වාතාවරණය හේතුවෙන් අපේක්ෂා කළ ඇතැම් වැය විෂයන්ගේ විචලනයන් ඇති විය. මෙම වර්ෂයේ අයවැය ඵලදායි එකක් ලෙස සකස් කිරිමට වැඩි අවධානයක් යොමු කරන බව. | අයවැය තාර්කිකව පිළියෙල කිරිමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |